
# කඳුරට නවෝදය



# කඳුරට නවෝදාව

# 1989 — 1992

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

| | |
|---|---|
| පරි. අංකය | 6558 |
| වර්ග අංකය | 808 |
| දිනය | |


මුද්‍රණය: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

# එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්....



## කුඩා ගමේ සිට ප්‍රදේශයක් දක්වා

අප සංවර්ධන කටයුතු සංවිධානය කරන්නේ පහළම මට්ටමේ සිටය. එනම්, එක් එක් පුද්ගලයා හා ගෘහමූලිකයාගේ මට්ටමේ සිටය. ගෘහමූලිකයෝ කණ්ඩායම් ලෙසින් සංවිධානය වෙති. මේ කණ්ඩායම් වලින් ප්‍රජාවන් සමන්විත වෙයි. බලතල පහළ මට්ටමටම බෙදාහරින ලද නව ක්‍රමය යටතේ එක් එක් ගෘහමූලිකයා හෝ ප්‍රජාව තමන්ගේ දියුණුවට කළයුතු දේ ගැන ස්වාධීනවම තීරණය කර වැඩට බසී. රජය කරන්නේ ඔවුන්ගේ ප්‍රයත්නවලට සහාය වීමය. සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් කෙරෙන්නේ ප්‍රාදේශීය මට්ටමිනි. ප්‍රාදේශීය මට්ටමින් කෙරෙන සංවර්ධන වැඩ කටයුතුවලට මුදල් ලබාදීමට විශේෂ ඉඩකඩ සැලසෙනු ඇත.

(පිටුව 16 – ඡේදය 26)


## පළාත් පාලනය

සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් ප්‍රාදේශීය පදනමකින් වෙන්කොට දෙනු ලැබේ. මෙම කාරණයේදී මිනුම්දඬු හැටියට සලකනුයේ ජනගහනය, ප්‍රදේශයේ නිශ්චිත අවශ්‍යතා, ප්‍රදේශයේ පවත්නා නොදියුණුකමේ හා දිළිඳු භාවයේ ප්‍රමාණය යන කරුණුය. මේ අනුව ගම් මට්ටමේ සිට පළාත දක්වා වන මට්ටම් වල සිටින සියළු දෙනාට සංවර්ධන සම්පත් පරිහරණය කොට තම යහපත සළසා ගැනීමට අවස්ථාව ලැබේ.

කාර්යසාධනයට සරිලන ආකාරයෙන් දෙනු ලබන ආධාර දීමනා වශයෙන් ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධනයට ලැබෙන්නට සළස්වන අතිරේක මුදල් සංචිතයක්ද වේ. කාර්ය සාධනයට අනුරූප වශයෙන් දෙන මෙම ආධාර දීමනා ඒ ඒ පෙදෙස්වල ජන කොටස් වලට ලබාගත හැකි වන්නේ ඔවුන් සිය ප්‍රදේශයෙන් ඇත්ත වශයෙන්ම ඉටු කරන සංවර්ධන කටයුතුවල ප්‍රමාණයේ හැටියටය.

(පිටුව 76 – 77, ඡේද 4 සහ 5)

ඉතිහාසයේ යුග ගණනක් අඳුරු කාල පරිච්ඡේද වලින් වැසී ගොස් තොදියුණු බවේ ගැලී තිබුණු තුන් සිංහලයේ අවසන් රාජධානිය සංවර්ධනයේ ආලෝකයෙන් පිබිදී ප්‍රගතියේ හිරු රැසින් ඔකඳ වී පුනර්ජීවය ලබන්නට මාවත දැන් විවර වී ඇත. මධ්‍යම රජය, පළාත් සභාව හා ප්‍රාදේශීය සභා යන තුන් මුළුව එකතු වී දියත් කරන යෝධ සංවර්ධන ප්‍රයත්නය පිළිබඳ ව කරනු ලබන විස්තරයකි මේ.



පොදුජන රැස්වීම ජනපති පදවියෙහි දිවුරුම් දුන් රණසිංහ ප්‍රේමදාස ජනපතිට ඓතිහාසික දළදා මාළිගාව ඉදිරියේ ජනතා උපහාර

# මහනුවර දිස්ත්‍රික් සිතියම

## ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාශ මායිම් සහිත




1 උඩුනුවර
2 යටිනුවර
3 ගඟවට කෝරලේ
4 තුම්පනේ
5 හාරිස්පත්තුව
6 පූජාපිටිය
7 අකුරණ
8 පාත දුම්බර
9 කුණ්ඩසාලේ
10 පන්විල
11 මැද දුම්බර
12 උඩ දුම්බර
13 මිණිපේ
14 පාත හේවාහැට
15 ගඟ ඉහළ කෝරලේ
16 උඩ පලාත
17 පස්බාගේ කෝරලේ



# කඳුරට නවෝදාව

## පුනර්ජීවනයක අවශ්‍යතාවයක් :

ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදී ග්‍රහණයට නතුවීමේ දී අවසන් මොහොත දක්වාම අධිරාජ්‍යවාදීන්ට එරෙහිවීමට කන්ද උඩරට වැසියනට හැකිවූයේ එබඳු අරගලයක් ගෙනයාමට ඔවුන්ට ශක්තිය හා ධෛර්ය තිබූ බැවිනි. 1815 දී කන්ද උඩරට රාජධානිය බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට නතුවීමත් සමග ම අධිරාජ්‍යවාදීන් කටයුතු කලේ විවිධ වගාවන් හඳුන්වාදීම තුළින් කඳුරට ධන සම්පත් සිය මව් රටේ පෝෂණය සඳහා යොදා ගැනීමටයි.

බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහිව නිදහස් අරගල මෙහෙය වීමේ හේතුවෙන් ඉංග්‍රීසීන් විසින් කඳුරට ප්‍රදේශය නොසලකා හරින ලදි. එමෙන්ම මෙම ප්‍රදේශවල ජනතාව ඔවුන්ගේ නොරිස්සුමට ද භාජනය විය.

1948 න් පසුව වුවද කඳුරට. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය සඳහා කිසිදු විශේෂ දීර්ඝකාලීන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවිය. මහනුවර දෙවන නගරය වුවද 1948 සිට 1989 දක්වා ප්‍රමාණවත් සංවර්ධනයක් සිදු නොවූ නගරයක් වශයෙන් හැඳින්විය හැකිය. අවම තරමින් නව ගොඩනැගිලි ඉදිකිරීමක් හෝ සිදුව ඇත්තේ කලාතුරකිනි. දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවල ද තත්ත්වය එසේම විය.

පසුගිය කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවල බිහිසුණු තත්ත්වයක් ඇතිවීමට මූලික හේතුවක් වූයේ මෙම නොසලකා හැරීමේ හේතුවෙන් තරුණ කොටස් තුළ අසහනය වර්ධනය වීම නිසා යයි සිතිය හැකිය. 1948 න් පසු අනෙකුත් පළාත්වල විවිධ කර්මාන්ත ශාලා ඇති කරනු ලැබුව ද මහනුවර ප්‍රදේශයේ ජාතික මට්ටමේ එකම කර්මාන්ත ශාලාවක් හෝ බිහි වී නැත. ඉඩම් හිඟය, සේවා වියුක්තිය. නිවාස හිඟය වැනි ප්‍රශ්න උග්‍ර විය. මේවාට විසඳුම් වශයෙන් ප්‍රමාණවත් ආයෝජන යෙදීම හෝ මූලික පහසුකම් සැලසීම හෝ සිදු නො විය. කෘෂිකර්මය ප්‍රධාන ජීවනෝපාය කරගත් බහුතර ජනතාව මුහුණ දුන් ඉඩම් හිඟය. ජල හිඟය. අලෙවි හා වෙනත් පහසුකම් නො මැතිවීම වැනි ප්‍රශ්න වලට ද විසඳුමක් ලැබුණේ නැත. මෙම ප්‍රදේශයේ ජනතාවට තිබූ එකම සම්පත ස්වභාවධර්මයාගේ දායාදයෙන් ලැබුණ යහපත් දේශගුණික තත්ත්වය පමණි.



ජනපති ධුරය ලබා ප්‍රථම වරට ජාතිය අමතමින්.

## නව පුනර්ජීවනයක්:

1989 පෙබරවාරි 02 දින සෙංකඩගල පුරවරයේ දළදා සමිඳුන් ඉදිරියේ දිවුරුම්දී පදවිප්‍රාප්ත වූ ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා ඓතිහාසික පත්තිරිප්පුවේදී ජාතිය අමතමින් මෙසේ පැවසුවා.

"රාජ්‍ය තන්ත්‍රයට සහභාගිවීමට ජනතාව තුළ උනන්දුවක් ඇති වෙන්නෙ රජය මානුෂික හැඟීමෙන් යුක්තව ජනතා දුක සැප ඕනෑකමින් සොයා බලන තමන්ගේම සංවිධානයක් යයි ජනතාවට හැඟෙනවා නම් පමණයි. පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක කරගන්ට නම් පරිපාලනය විමධ්‍යගත කරන්න ඕනැ. ජනතා අවශ්‍යතාවලට උරදෙන රජය ජනතාව අතරටම යන්න ඕනැ. ප්‍රශ්න ඇති නැතදීම ඒවා විසඳන්න ඕනැ. මෙය ගම්දනව්වල හැදී වැඩී එන තරුණ පරපුරත් පොදු කටයුතු වලට සම්බන්ධ කරගන්නට පුළුවන් වන එක් ක්‍රමයක්. අපි ඔවුන්ගේ දැඩි උද්යෝගයත්, යොවුන් ශක්තියත් මාතෘභූමියේ එලදායී අභිවෘද්ධිය සඳහා යොදා ගත යුතුයි."

සෑම වර්ෂයකම ජනපති පදවිප්‍රාප්ති සංවත්සර දිනයේදී ජාතිය ඇමතීමටත්, ආගමික වතාවත්වල යෙදීමටත් ශ්‍රීමත් ජනාධිපතිතුමා විසින් මහනුවර නගරය තෝරාගෙන ඇත. වසරක් පාසා සිය දේශපාලන හා පරිපාලන කටයුතු ආරම්භ කිරීමට පෙර මහනුවර නගරයට ගොස් දළදා සමිඳුන් වැඳ පුදා ගන්නේ මෙම ඓතිහාසික නගරයේ පවතින අද්විතීය සම්පන්න භාවය පිළිබඳව එතුමා තුළ ඇති විශ්වාසය නිසාමය. එතුමා වෙනත් කිසිදු පාලකයෙකු නොදැක්වූ අන්දමින් මහනුවර දිස්ත්‍රික්කයට විශේෂ අවධානයක් යොමුකරමින් එම ප්‍රදේශයේ සංවර්ධනය සඳහා පියවර රාශියක් ගෙන ඇත. නිරන්තරයෙන් මහනුවර ප්‍රදේශයේ සංවර්ධනය සියැසින් දැක ගැනීම සඳහා යාම එතුමා පුරුද්දක් බවට පත්කර ගෙන ඇත.

කිසිදු වෙනසක් නොවී පැවතුන මහනුවර නගරයේ වෙනස්කම් රැසක් 1989 න් පසු ආරම්භ විය. දළදා මැදුරෙහි රන් වියන නතවා මහමළුව ප්‍රතිසංස්කරණය කිරීමත්, ආගමික සිද්ධස්ථාන පුනර්ජීවනය කරා



රන්වියනින් සැදුම්ලත් දළදා මාලිගාව: - ආගමික පුබෝදය -

ගෙනයාමටත් කටයුතු යෙදිණි නගරයේ වෙනස්කම් රැසක් සිදුවිය. විලියම් ගොපල්ලව මාවත ඉදිකර නගරයේ මේ දක්වා පැවති වාහන ගමනා ගමනයේ තදබදයට පිළියම් යෙදිණි. බෝගම්බර සිරගෙදර ඉවත් කිරීමට ද සැලසුම් කර ඇති අතර. මධ්‍යම බස්නැවතුම්පොල අංගසම්පූර්ණ ව ඉදිවෙමින් පවතී. ජෝර්ජ් ඊ ද සිල්වා උද්‍යානය නවීන උද්‍යානයක් බවට පරිවර්තනය වෙමින් පවතී. නාගරික ප්‍රශ්න විසඳීම සඳහා නව ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

## මහනුවර ප්‍රදේශයේ දියුණුවට ලක්ෂ හාර දහස් නමසීයක් :

මහනුවර දිස්ත්‍රික්කයේ ආර්ථික සංවර්ධනය සඳහා ද කටයුතු සලසා ඇත. සංවර්ධන වැඩ සටහන් විමධ්‍යගත අය වැය, පළාත් සභා අමාත්‍යාංශ අරමුදල්, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය සහ උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය වැනි ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වේ. 1989 - 92 දක්වා කාලය තුළ ඉහත කී යෝජනා ක්‍රම යටතේ වැයකර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් ලක්ෂ හාරදහස් නමසීය අනූ නුනකි.

මෙවැනි පුළුල් සංවර්ධන වැඩ සටහන් මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වී ඇත්තේ ඉතිහාසයේ ප්‍රථම වරටය. මෙයා මුදල් සම්භාරයක් ආයෝජනය කිරීම තුළින් මහනුවර දිස්ත්‍රික්කයේ මහජනතාවගේ සුභ සිද්ධියත්, ජීවන තත්ත්වයත් ඉහළ නැංවීමට පියවර ගෙන ඇත.

## මහනුවර දිස්ත්‍රික්කය :

මහනුවර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය දොළොස් ලක්ෂ දහහතර දහස් විසි එකකි. මුළු පවුල් සංඛ්‍යාව 2,18,236කි. භූමි ප්‍රමාණයේ විශාලත්වය ජලාශ හැර වර්ග කිලෝ මීටර් 1906.3කි.

මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා 17කි. එයින් වර්ග ප්‍රමාණයෙන් විශාලම ප්‍රාදේශීය සභාව උඩුදුම්බර වේ. කුඩාම ප්‍රාදේශීය සභාව අකුරණ වේ. ජනගහනය අතින් විශාලම ප්‍රාදේශීය සභාව මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව වන අතර. අඩුම ජනගහනයක් ඇත්තේ උඩුදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළය. මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති එකම මහනගර සභාව මහනුවර මහනගර සභාව වන අතර, ගම්පල, නාවලපිටිය, කඩුගන්නාව සහ වත්තේගම වශයෙන් නගර සභා හතරක් ඇත. මුළු දිස්ත්‍රික්කයේ සේවා නියුක්ති ප්‍රමාණය 3,57,950කි. සේවා වියුක්ත ප්‍රමාණය 77,000ක් පමණ වේ.

## සෑම දොළොස් දෙනෙකුගෙන්ම එක් අයෙකුට ජනසවිය :

ජනසවිය යෝජනා ක්‍රමය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති කොට්ඨාශ වලින් පළමු වටය යටතේ අකුරණට ද, දෙවන වටය යටතේ පූජාපිටිය සහ උඩුදුම්බර ද, තුන්වන වටය යටතේ මිණිපේ ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයට ද ජනසවි ආධාර ලබා දී ඇත. මුළු ජනසවිලාභී පවුල් සංඛ්‍යාව පිළිවෙළින් මුල්වටයේ 4020කි. දෙවන වටයේ 10,416කි. තුන්වන වටයේ 5526කි. මුළු පවුල් සංඛ්‍යාව 19,962කි. එම පවුල්වලට අයත් පුද්ගලයන් සංඛ්‍යාව ලක්ෂයකි. ඒ අනුව මෙම දිස්ත්‍රික්කයේ සෑම පුද්ගලයන් දොළොස් දෙනෙකුගෙන්ම එක් අයකු ජනසවි ලබන පවුලකට අයත් වේ.

ජනසවිය පළමු වටය අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආරම්භ වන විට ආහාර මුද්දර ප්‍රතිලාභීන් 30,120ක් සිටියද ජනසවිය ආධාර ක්‍රමයෙන් පසු එම ප්‍රමාණය 13,549 දක්වා අඩුවිය. 1991 මාර්තු මාසය වනවිට අකුරණ බල ප්‍රදේශයේ ජනසවිලාභීන් සිය උත්සාහයෙන් නැගී සිටීමේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර ඇත. මොවුන් විසින් ආරම්භ කළ ස්වයං රැකියා ව්‍යාපෘති ප්‍රමාණයෙන්ම එය ඔප්පු වේ.

| කෘෂිකර්ම | කර්මාන්ත | වෙළඳ | සේවා | පුහුණු | මුළු |
| --- | --- | --- | --- | --- | --- |
| 500 | 427 | 411 | 131 | 1041 | 1468 |

ඉතිරි අයට ද ස්වශක්තියෙන් නැගී සිටීම සඳහා ජනසවිය භාරකාර අරමුදල නවදුරටත් එම ප්‍රදේශයේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

එපමණක් නොව අකුරණ ජනසවිලාභී පවුල් 3999ක් විසින් නැත්පත් කරන ලද මුදල රුපියල් එක් කෝටි නව ලක්ෂ හැට දාස් දෙසිය හැත්තෑ හතරකි. නමත්වස කියා කිසිදු ඉතුරු කිරීමක් නොතිබූ අහිංසක ජනතාවට මෙම රජය විසින් ලබා දුන් විශිෂ්ඨ තිළිණයකි මේ.

## ඉඩම් නැති ජනතාවට ඉඩම් :

ශ්‍රී ලංකාවේ ඉඩම් හිඟය පිළිබඳ ප්‍රශ්නයට පිළියමක් වශයෙන් කඩිනමින් ඉඩම් බෙදාදීම සඳහා ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමන් විසින් දියත් කළ ජාතික ඉඩම් භාවිතය හා බෙදා හැරීම පිළිබඳ ජනාධිපති කාර්යසාධන වැඩපිළිවෙළ යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය විසඳීමෙහිලා පියවර රැසක් ගෙන ඇත. පසුගිය වසර අවසන් වනවිට බෙදාහැරීම සඳහා හඳුනාගත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1526කි. දැනට බෙදාදී තිබෙන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1471කි. අයිතිය තහවුරු කිරීමට 2898 දෙනෙකුට ඉඩම් බලපත්‍ර නිකුත් කර ඇත.

1992 අගෝස්තු වනවිට වෙන්කර දී ඇති ස්වර්ණභූමි ඉඩම් කට්ටි ගණන 27830කි. සකස් කර ඇති දීමනා පත්‍ර සංඛ්‍යාව 11973කි. සකස් කළ යුතු සංඛ්‍යාව 15816කි.

මධ්‍යකාලීන ආයෝජන යටතේ ඉඩම්, වාරි මාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය මඟින් වෙන්කර ඇති රු.5,62,000/-ක මුදලින් දෙන ලද ඉඩම්වල සුදුසු භෝග වර්ග වගා කිරීමට ගොවීන්ට පැළ වර්ග හා ගොවි උපකරණ බෙදා දේ. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මේ සඳහා රු.2,77,360/-ක් වැයකර ඇත. 1990 - 92 වර්ෂයන්හි ඉඩම් සංරක්ෂණයට පමණක් රු.4,55,707/-ක් වැයකර තිබේ.

## සෑම පවුල් හතකින් එක් පවුලකට නිවසක් :

1989 - 90 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගේ නිවාස පහසුකම් සපුරාලීමේ රජයේ වැඩ සටහන යටතේ විශාල ප්‍රමාණයක ප්‍රතිලාභීන් වී ඇත්තේ ග්‍රාමීය ජනතාවයි. මහනුවර දිස්ත්‍රික්කයේ පස අවුරුදු නිවාස සංවර්ධන වැඩ සටහනට අනුව ග්‍රාමීය නිවාස 13,000ක් 1992 අවසන් වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත. නාගරික නිවාස 1400කි.
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව ණය ආධාර සපයා ඇත. 1989 - 92 දක්වා නිවාස 11,450 කට ණය ආධාර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සපයා දී ඇත. මෙහිලා විශේෂ වැදගත්කමක් වනුයේ ජනාධිපති කාර්යසාධන මණ්ඩලයෙන් ලබා දුන් ඉඩම්වල 1990 - 92 වනවිට නිවාස 1699ක් හා ජනසවිය යෝජනා ක්‍රමය යටතේ නිවාස 900ක් ඉදිකර තිබීමයි. සේවා වනිතා ආධාර යටතේ 1992 දී නිවාස 2500ක් ඉදිකරනු ඇත. මේ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ රජයේ නිවාස වැඩපිළිවෙළ යටතේ දිස්ත්‍රික්කයේ සෑම පවුල් හතකින් එකකට ම නිවාසයක් ලැබී ඇත.



උදාගම් ව්‍යාපාතියක් ජාතියට සෙවන සදා

## විසිපත් දහස් පන්සියයකට ඇඟලුම් කම්හල් දහහතක රැකියා :

ඇඟළුම් කම්හල් 200ක් උප දිසාපති කොට්ඨාශ මට්ටමින් දිවයින පුරා කඩිනමින් පිහිටුවීමේ රජයේ වැඩපිළිවෙල යටතේ මහනුවර දිස්ත්‍රික්කය තුල ඇඟලුම් කම්හල් දහහතක් අලුතින් ඉදිවෙනු ඇත. ඉන් හතරක් ආරම්භ කිරීම සඳහා දැනටමත් මූලික කටයුතු යොදා ඇත. මහනුවර කඩවත්සතර, යටිනුවර, පූජාපිටිය සහ පාතදුම්බර යන ප්‍රාදේශීය බල ප්‍රදේශවල මෙම ඇඟලුම් කම්හල් හතර ඉදිකරනු ඇත. ඉන් පළමුවන කම්හල පාතදුම්බර ප්‍රාදේශීය බල ප්‍රදේශයේ 1992.09.18 දින ශ්‍රීමත් ජනාධිපතිතුමා විසින් ජනතා සුභසිද්ධිය සඳහා විවෘත කරනු ඇත. එම එක් ඇඟලුම් කම්හලකින් අවම වශයෙන් තරුණ තරුණියන් 500කට සෘජුවම රැකියා සැපයේ. මෙබඳු කර්මාන්ත ශාලා ආරම්භ කිරීමේදී ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ රැකියා උත්පාදන අවස්ථා බහුල වේ. එනම් කර්මාන්ත ඉදිකිරීමේදී ප්‍රදේශයේ පවත්නා සම්පත් භාවිතයට ගැනීමෙන් එම සම්පත්වල හිමිකරුවන්ගේ ආදායම් තත්ත්වය වැඩි වන්නාසේම කර්මාන්ත ශාලා ඉදිකිරීමට අවශ්‍ය මේසන්වරු, වඩු කාර්මිකවරු සහ අනෙකුත් අයගේ අවශ්‍යතාවයන් පැන නැගීමෙන් ඒ අත්දමින් ද රැකියා ඉඩ ප්‍රස්ථා මතුවේ. එම පිරිස් ලබන ආදායම් විවිධ වූ පරිභෝජන ක්‍රම සඳහා වැය කිරීමේදී ඒ තුලින් තවත් පිරිසකගේ රැකියා මාර්ග උත්පාදනය වේ. මේ තුලින් එක් තරුණයෙකුට රැකියාවක් දීමෙන් තවත් දෙදෙනෙකුට ම රැකියා ඉඩ ප්‍රස්ථා ලැබේ යයි අපේක්ෂා කෙරේ. ඒ අනුව එක් ඇඟලුම් කම්හලකින් සෘජු වශයෙන් රැකියා අවස්ථා 500 ක්ද සෘජු නොවන රැකියා 1000ක්ද ඇතිවේ. මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති බල ප්‍රදේශ තුල කම්හල් දාහතකින් තරුණ තරුණියන් 25000කට රැකියා ලැබෙනු ඇත. මේ තුලින් ගැමි තරුණ අසහනය දුරුකිරීමත් දුප්පත් ගැමි ජනතාව රටේ දියුණුවට සහභාගී කර ගැනීමත් අරමුණු කෙරේ.

# විමධ්‍යගත අයවැයෙන් වෙන්කල සම්පත් :

මහනුවර දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වැඩි වශයෙන් යොදවනු ලබන මූලය වන්නේ විමධ්‍යගත අයවැයයි. සෑම වර්ෂයකම එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රුපියල් විසිපත් ලක්ෂයක් බැගින් විමධ්‍යගත අයවැයෙන් වෙන් කෙරේ. 1989 - 92 දක්වා වෙන් කරන ලද මුදල් පහත සඳහන් අංශවල ඒ ඒ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් වියදම් කර ඇත.



අග්‍රාමාත්‍ය ගරු ඩී.බී. විජේතුංග මැතිතුමා

## ගරු අග්‍රාමාත්‍ය ඩී. බී. විජේතුංග මැතිතුමා :

අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය, කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයා වශයෙන් ඩී.බී.විජේතුංග මැතිතුමා ප්‍රදේශයට කර ඇති සේවය අතිමහත්ය. විමධ්‍යගත අය වැය යටතේ තමාට වෙන්කරන ලද මුදල් දිස්ත්‍රික්කයේ ගම් දනව්වල විදුලිය, මහා මාර්ග, සෞඛ්‍ය, අධ්‍යාපනය හා ස්වයං රැකියා යනාදි වශයෙන් ජනතාවගේ මූලික පහසුකම් සැලසීම සඳහා වැය කර ඇත.

## විදුලිය:

විදුලිය සඳහා පමණක් මෙම වසර තුන ඇතුළත රුපියල් 14,23,710ක් වෙන්කර ඇත. මෙම මුදලින් 1989 දී ගම් ප්‍රදේශ හයක් සඳහාත් 1990 දී ගම් ප්‍රදේශ හතක් සඳහා ද, 1991 දී රුපියල් 11,970ක් වැයකර එක් ගමකටත් විදුලිය ලබා දී ඇත. 1989 දී රිලාගල හා අහස්පොකුණ යන ගම්මානවලට රුපියල් එක් ලක්ෂ හැට පන්දාහක් (1,65,000/-) වියදමින් විදුලිය ලබා දී ඇත. පාසල්, ආරෝග්‍යශාලා, විහාරස්ථාන, වෙනත් රජයේ කාර්යාලවලට ද විදුලිය ලබාදීම මඟින් ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය පහසුවෙනවා පමණක් නොව ඒ හා බැඳුන ඔවුන්ගේ ජීවන තත්ත්වය දියුණු කර ගැනීමට හැකිවන සුළු හෝ මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ආරම්භ කිරීමට ද විශාල පිටුවහලක් වනු ඇත. විශේෂයෙන්ම තම තමන්ගේ නිවෙස්වල ස්වයං රැකියා ආරම්භ කිරීමට විදුලිබලය උපයෝගී කරගනු ඇත.

## අධ්‍යාපනය:

පාසල් ගොඩනැගිලි සංවර්ධනය, ඉඩම් ලබාදීම, පාසල් උපකරණ ලබාදීම ආදිය වෙනුවෙන් විජේතුංග මැතිතුමා විසින් විශාල මුදල් ප්‍රමාණයක් වැයකර ඇත. මහාමායා බාලිකා විද්‍යාලය, ලංකා තිලක බාලිකා විද්‍යාලය, උඩුනුවර මධ්‍ය මහා විද්‍යාලය, උඩුනුවර පාතිමා විද්‍යාලය, රංගම, ගඩලාදෙණිය, හන්දෙස්ස, වටටප්පල හා ගෝතමී බාලිකා විද්‍යාල් වලට තූර්ය වාදන භාණ්ඩ සැපයීම සඳහා රුපියල් පන් ලක්ෂ දාහතර දහස් දෙසිය හතලිස් හතරක් (514,244) 1989 දී වැයකර ඇත.
1990 දී තවත් පාසල් පහක් සඳහා රුපියල් 382,500ක් ද, 1991 දී අගුනාවල වඩු පාසල් ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම සඳහා රුපියල් හැත්තෑ නම දාස් පන්සිය තිස් එකක් ද (79,531) වැයකර ඇත.

## මහා මාර්ග:

ආර්ථික සංවර්ධනයේදී මාර්ග පහසුකම් තිබීම වැදගත් සාධකයකි. ගමක දියුණුවට එම ගමට ඇතුළුවිය හැකි මංමාවත් තිබිය යුතුය. විදුලිය, අධ්‍යාපනය, රැකියා ඉඩ ප්‍රස්ථා හා පොදු සේවා සැලසීමේදී මාර්ග පහසුකම් තිබිය යුතුය යන්න අවබෝධ කර ගනිමින් 1989 වර්ෂයේ අග්‍රාමාත්‍ය ගරු ඩී.බී.විජේතුංග මැතිතුමා විසින් මාර්ග 18ක් රුපියල් අට ලක්ෂ දහදාස් නමසිය හැට පහක වියදමින් දියුණු කරවා ඇත. මේ මාර්ග පිළිසකර කිරීමේදී ගම් ප්‍රදේශයන්ට ඇතුළුවීමේ මාර්ග මෙන්ම ප්‍රදේශයේ පොදු ස්ථාන, වාරි යෝජනා ක්‍රම, ඉඩම් ආදියට ප්‍රවිෂ්ඨවීමේ බාධක ද මගහැරවීමට උත්සාහ ගෙන ඇත. 1990 දී අලපලාවල බෝස්ගොඩ අමුණ ළඟ පාර ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් 65,000ක් වැයකර ඇත.

## ස්වයං රැකියා:

අඩු ආදායම් ලබන පවුල්වල ජීවන තත්ත්වය නංවාලීම සඳහාත්, දිස්ත්‍රික්කයේ පාසල් හැරගිය හෝ අධ්‍යාපනය හමාර කළ තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් සඳහාත් ස්වයං රැකියා ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ඇත. මේ සඳහා උඩුනුවර ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ, කාන්තා ජංගම පුහුණු වැඩ සටහන් සඳහා හා ජුකි මැෂින් පුහුණු මධ්‍යස්ථානයට ආරක්ෂක බැම්මක් බැඳීම සඳහා රුපියල් එක් ලක්ෂ විසි දාහක් (1,20,000) වැයකර ඇත.

## පොදු සේවා:

පොදු සේවා වශයෙන් ප්‍රජා ශාලා, ග්‍රාම සංවර්ධන ශාලා ඉදිකිරීම, පොදු ළිං පිළිසකර කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ක්‍රීඩා භාණ්ඩ සැපයීම ආදිය සඳහා මුදල් වැයකර ඇත.

## ගරු ඒ.සී.එස්. හමීඩ් මැතිතුමා:

මහනුවර දිස්ත්‍රික්කයේ දියුණුව සඳහා විමධ්‍යගත අයවැය යටතේ ගරු ඒ.සී.එස්.හමීඩ් ඇමතිතුමා විශාල මුදලක් වෙන් කර ඇත. මෙම මුදල් ප්‍රදේශයේ විදුලිය සැපයීම, මහා මාර්ග තැනීම, අධ්‍යාපනය නැංවීම සහ පොදු සේවාවන් රැසක් නිමකිරීම සඳහා වැයකර ඇත.

## විදුලිය සැපයීම:

1989 වර්ෂයේ විදුලිය සඳහා රුපියල් තුන් ලක්ෂ අනූදහස් අටසිය තිස් අටක් (3,90,838) වැය කරමින් කුරුගස්පිටියේ ගෙදර ගම් ප්‍රදේශය, ගල්හින්න පාර, අක්කරෙඩි ජනපදය ආදී ගම්වලට විදුලිය සපයා දී ඇත. 1990/91 වර්ෂවල රුපියල් තුන් ලක්ෂ අසූ හතරදාස් දෙසිය අනූ නමයක් (3,84,299) වැය කරමින් කුරුගොඩ, කුඹුක්කොටුව, ජයන්ති මාවත, කොතකලගල විජිතාරාමය වැනි ප්‍රදේශවලට විදුලි පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.



ඒ.සී.එස්. හමීඩ් මැතිතුමා

## අධ්‍යාපනය:

ඒ.සී.එස්.හමීඩ් ඇමතිතුමා විමධ්‍යගත අයවැය යටතේ ලැබුණු මුදල් විශාල වශයෙන් වැයකර ඇත්තේ ප්‍රදේශයේ නොදියුණු පාසල් සංවර්ධනය සඳහාය. මෙහිදී විශේෂයෙන්ම පාසල් ගොඩනැගිලි පහසුකම් ලබාදීමට කටයුතු කිරීම වැදගත් තැනක් ගෙන ඇත. 1989 වර්ෂයේ මැදවල මහා විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ලක් සෑදීම සඳහා ප්‍රථම අදියරේ පමණක් රුපියල් තුන් ලක්ෂ අසූ පන්දාහක් (3,85,000) වෙන්කර ඇත. 1990 වර්ෂයේ නුගවෙල මහා විද්‍යාලයේ වහලය අළුත්වැඩියා කිරීම, හල්ගොල්ල මුස්ලිම් විද්‍යාලයට ආරක්ෂක බැම්මක් ඉදිකිරීම, ඉතිගල මුස්ලිම් විද්‍යාලයට විද්‍යා කාමරයක් ලබාදීම, අලවතුගොඩ දෙමළ විද්‍යාලයට ගොඩනැගිල්ලක් ලබාදීම ආදිය සඳහා වැයකර ඇති මුදල රුපියල් හය ලක්ෂ විසිතුන් දාස් එකසිය හතළිස් හයකි. (6,23,146) ඒ අනුව සිංහල මුස්ලිම් හා ද්‍රවිඩ ආදී සෑම වර්ගයකම සිසුන්ගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීමට එතුමා වගබලාගෙන ඇත. 1991 වසරේදී අධ්‍යාපනික කටයුතු සඳහා මුදල් වැයකර ඇත්තේ විශේෂයෙන්ම පාසල්වල අඩුපාඩු සපුරාලීම සඳහා ය. මේ අනුව හාරිස්පත්තුව ආසනයේ පාසල්වලට ලී බඩු සැපයීම සඳහා රුපියල් පන් ලක්ෂ තිස් හය දාස් පන්සිය විසි පහක් (5,36,525) වැයකර ඇත.

## මහා මාර්ග:

1989 වර්ෂයේ පමණක් දිස්ත්‍රික්කයේ ගම් ප්‍රදේශ 11ක මහා මාර්ග සංවර්ධනය කිරීම සඳහා රුපියල් නම ලක්ෂ පණස් අට දාස් එකසිය අසූ පහක (9,58,185) මුදලක් වැයකර ඇත. රඹුකේඇල, පල්ලිය පාර, රජපිහිල්ල, එඩරුතැන්න පාර, උඩයාර්විඩු පාර මේ අයුරින් දියුණුවට

පත්වූ මහා මාර්ග අතරින් කිහිපයකි. මොලගොඩ රාජකරුණානායක මාවත ඉදිකිරීම සඳහා රුපියල් පණස් දාහක් (50,000) බටඅඹේ කොලතිය පාර තැනීම සඳහා රුපියල් හැත්තෑ පන්දාහක් (75,000) මහකඹුරුවෙල පාර අළුත්වැඩියාව ආදී වශයෙන් රුපියල් හාර ලක්ෂ අසූ පන්දාහක් (4,85,000)ද 1991 වර්ෂයේ රුපියල් එකොළොස් ලක්ෂ පණස් දෙදාස් අටසිය විසි නවයක්ද, (11,52,829) මාර්ග සංවර්ධනය සඳහා යොදවා ඇත.

**පොදු සේවාවන් :**

ප්‍රදේශයේ මහජනතාවගේ සුභසිද්ධියට අදාල වන පොදු සේවාවන් රැසක් ඒ. සී. එස්. හමීඩ් ඇමතිතුමා විසින් සිදුකර ඇත. මේ අතරින් විශේෂත්වයක් ගන්නේ එතුමා ආරම්භ කළ ජල යෝජනා ක්‍රමයන්ය. පල්ලෙකැලේ හමුදා කඳවුරේ ජලනල එලීම. මාලගම්මන සිරිවර්ධනාරාමයට ජලය සැපයීම. කුරුඳුගහ ඇල ජල යෝජනා ක්‍රමය ආදිය සඳහා 1989 දී රුපියල් එක් ලක්ෂ අසූ හතර දාස් අටසිය එකොළහක් (1,84,811) වැයකර ඇත. තවද පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආරක්ෂක බැම්ම යෙදීම. මහනුවර පොලිස් අභ්‍යාස විද්‍යාලයට ගෘහභාණ්ඩ සැපයීම. නාථ දේවාලයට සංරක්ෂණ කටයුතු කිරීම ආදිය එබඳු පොදු සේවාවන් වලින් කිහිපයකි. 1990 දී රුපියල් නම ලක්ෂ පණස් දාහක් ද (9,50,000) 1991 දී රුපියල් තිස් හතරදාස් පන්සීයක් ද (34,500) මේ අන්දමින් ද පොදු සේවාවන් වශයෙන් වැයකර ඇත.



ආර්.පී.විජේසිරි මැතිතුමා

**ආර්. පී. විජේසිරි** : (1990 දෙසැම්බර් මස දක්වා)

**විදුලිය :**

1989 වර්ෂයේ පමණක් ගම් ප්‍රදේශ අටකට විදුලිය ලබාදීම සඳහා විවිධ පියවර ගෙන තිබේ. මෙම වර්ෂයේ මිගම්මන ප්‍රදේශයට විදුලි ආලෝකය ලබාදීම සඳහා රුපියල් දෙලක්ෂ හතලිස් අට දාහක් (2,48,000) වැයකර ඇත. කලාපුර කත්දෙගල ගම්මානයට රුපියල් එක් ලක්ෂ හැට දෙදාස් පන්සීයක් (1,62,500) වැයකරමින් විදුලිය ලබා දී ඇත. ගැටතේනැන්න සහ දූන්කොන යන පාරවල් වලට විදුලිය ලබාදීම සඳහා 1990 දී රුපියල් දෙලක්ෂයකට (2,00,000) ආසන්න මුදලක් වැයකර ඇත.

**මහා මාර්ග :**

1989 දී රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හත් දාහක් ද. (3,77,000) 1990 දී රුපියල් හතලිස් පන් දාහක් ද. (45,000) මහා මාර්ග සංවර්ධනයට යොදවා ඇත. සිරිමල්වත්ත. හත්තොටුගල පාර. මැණික්හින්න පොදු වෙළඳපොල පාර හා ළමා උයනට පිවිසෙන පාර ඇතුළු මාර්ග හතරක් සංවර්ධනය කර ඇත.

**අධ්‍යාපනය :**

1989 වර්ෂයේ විමධ්‍යගත අයවැයෙන් වෙන්කර ඇති මුදලින් රුපියල් දෙලක්ෂ විසි නම දාස් පන්සීයක (2,29,500) මුදලක් උඩගම, මැණික්හින්න හා මහවත්ත විදුහල් වලට විද්‍යාගාර තැනීම සඳහා වැයකර ඇත.

**ස්වයං රැකියා :**

ප්‍රදේශයේ රජයේ ස්ථිර රැකියා නොමැති පාසල් හැරගිය තරුණයින් ස්වයං රැකියාවලට යොමුකරවීම සඳහා ඔවුන්ට සහය වී ඇත.
පල්ලෙකැලේ ගම්උදාව වෙනුවෙන් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය ඉදිකළ අලෙවිසැල සඳහා රුපියල් 10,000/-ක් ලබාදී ඇත.

**පොදු කටයුතු :**

මැණික්හින්න වෙළඳපොල ඉදිකිරීම. ළමා ක්‍රීඩාංගනය සංවර්ධනය. ප්‍රජා ශාලාව සඳහා ලී බඩු මිලදී ගැනීම සඳහා පමණක් 1989 දී රුපියල් හාර ලක්ෂ විසි අටදාස් තුන්සිය දෙකක් (4,28,302) වැයකර ඇත. 1989 සහ 1990 වර්ෂවල විශාල මුදලක් වැයකර ඇත්තේ මැණික්හින්න පොදු වෙළඳසැල ඉදිකිරීමේ කටයුතු සඳහා ය. මෙය අදියර කිහිපයකින් සිදුකර ඇති අතර. රුපියල් නම ලක්ෂ හැත්තෑ නම දාහක් (9,79,000) පමණ ඒ ඒ අවස්ථාවල වැයකර ඇත. මීට අමතර ව මැණික්හින්න ප්‍රදේශයේ පොදු සේවාවන් වලට අදාළ විශේෂ සේවාවන් රැසක් නිමකිරීමට පියවර ගෙන ඇත.

**හරින්ද්‍රනාත් දුනුවිල මැතිතුමා :**

**විදුලිය :**

1989 වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික්කයේ ගම්මාන හයකට විදුලිය ලබාදීම සඳහා රුපියල් පණස් ලක්ෂ දහහතර දාස් නමසීයක මුදලක් වැයකර ඇත. ඉන් පේරාදෙණිය පැණිදෙනිය පාරට සවිකරන ලද විදුලි ලාම්පු වෙනුවෙන් පමණක් රුපියල් එක් ලක්ෂ අනූ දෙදාස් පන්සිය පණහක් ද (1,92,550) 1991 වර්ෂයේ කත්දෙගම්මැද්ද පාර විදුලි දිගුව වෙනුවෙන් රුපියල් එක් ලක්ෂ හත්දාස් හාර සීයක් ද (1,07,400) වැයකර ඇත.



හරින්ද්‍රනාත් දුනුවිල මැතිතුමා

**මහා මාර්ග :**

1989 දී මාර්ග නවයක් අළුතින් සකස් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් හය ලක්ෂයක මුදලක් වැයකර ඇත. 1991 වර්ෂයේදී කොස්ඉන්න ජනපද මාර්ගයේ අඩි 1200 කට බොරළු දැමීමත්. අඩි 500 ක කොන්ක්‍රීට් පඩි සැදීම සඳහා රුපියල් තුන් ලක්ෂයකට (3,00,000) ආසන්න මුදලක් වැයකර ඇත. 1990 වර්ෂයේදී මාර්ග එකොළහක් සංවර්ධනය කර ඇත. මෙයින් හන්තාන නිවාස යෝජනා ක්‍රමයට යන පාර සකස් කිරීම සඳහා පමණක් රුපියල් ලක්ෂයක් වැයකර ඇත.

### ස්වයං රැකියා:

1989 වර්ෂයේදී සෙංකඩගල සහ මහනුවර. ස්වයං රැකියා ණයදීමේ ව්‍යාපෘතිත් යටතේ රුපියල් දෙලක්ෂ විසිපත්දාහක් ද. (2,25,000) දිස්ත්‍රික් තරුණ සේවා මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලාවක් සඳහා රුපියල් පණස් දාහක් ද. (50,000) ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙත් වැයකර ඇත. 1991 වර්ෂයේ බරවාහන රියදුරු පුහුණු පාඨමාලාව. ශීතකරණ. අධිශීතකරණ පාඨමාලා සඳහා රුපියල් විසි එක්දාස් පත්සියක් (21,500) වැය කර ඇත.

### පොදු සේවාවන්:

1989 වර්ෂයේ රුපියල් හත් ලක්ෂ විසිහත් දාහක් ද. (7,27,000) 1990 වර්ෂයේ රුපියල් නම ලක්ෂ හැත්තෑ අට දාස් හාරසිය හැත්තෑ පහක් ද (9,78,475) 1991 වර්ෂයේ රුපියල් හය ලක්ෂ හැත්තෑ හත් දාස් හයසිය පණහක් ද (6,77,650) ප්‍රදේශයේ පොදු සේවාවන් සඳහා යොදවා ඇත. මේ අතර මුල්ගම්පල නාගරික ප්‍රජාශාලාව වැඩිදියුණු කිරීම. සිත්තවෙල නව නිවාස යෝජනා ක්‍රමයේ වැසිකිළි සකස් කරදීම ආදිය සිදුකර ඇත. ඒ හැරුණුවිට ප්‍රදේශයේ මූලික අවශ්‍යතාවයක් වන ජලනල යෝජනා ක්‍රම රැසක් ඉටුකර ඇත. හීදගල ජල යෝජනා ක්‍රමයේ ටැංකිය අළුත්වැඩියාව, උඩපේරාදෙණිය ජල යෝජනා ක්‍රමයේ හරස්කඩය සකස් කිරීම ආදිය මේ අතර ප්‍රධාන වේ.

## ගැමුණු අබේසුන්දර මැතිතුමා :



ගැමුණු අබේසුන්දර මැතිතුමා

### විදුලිය:

1989 වර්ෂයේ ආඩියාගස්තැන්න විදුලි දිගුව සඳහා රුපියල් එක් ලක්ෂ අසූ හය දාහක් ද. (1,86,000) 1990 දී කොලුවල විදුලි දිගුවට රුපියල් තුන් ලක්ෂයක් ද. වැයකර තිබේ. 1989 සිට 1991 දක්වා රුපියල් දාසය ලක්ෂ හැට හයදාහක (16,66,000) පමණ මුදලක් විදුලිය පහසුකම් ලබාදීම සඳහා වැයකර ඇත.

### අධ්‍යාපනය:

ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි අළුත්වැඩියාව. විද්‍යාගාර පහසුකම් සැපයීම සඳහා විශාල මුදලක් වැයකර ඇත. 1989 වර්ෂයේ රුපියල් තිස් හත් දාහක්ද. (37,000) 1990 වර්ෂයේ රුපියල් හය ලක්ෂ අසූ පන්දාහක් ද. (6,85,000) 1991 වර්ෂයේ රුපියල් හත්දාස් නමසියක (7900) මුදලක් ද. මහනුවර ලේවැල්ල ගෝතමී බාලිකා විද්‍යාලය. තැන්නේකුඹුර කණිෂ්ඨ විද්‍යාලය. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය සහ ගැටබේ මහ විදුහල වැනි පාසල් මේ මඟින් සංවර්ධනය කර ඇත. පිළිමතලාව. කඩුගන්නාව. කුරුකුඟ්ගල මුස්ලිම් විද්‍යාලය හා ගත්තොරුව යන විද්‍යාලවලට ගොඩනැගිලි. විද්‍යාගාර හා ක්‍රීඩා පිට්ටනි ලබා දී ඇත.

### මහා මාර්ග:

උඩපේරාදෙණිය අංක 632 මාර්ග සංවර්ධනය සඳහා රුපියල් දෙලක්ෂ හතළිස් එක්දාහක් (2,41,000) 1989 වර්ෂයේ ද. හන්තානේ යෝජනා ක්‍රමයට පිවිසෙන මාර්ගය සඳහා රුපියල් ලක්ෂයක් (1,00,000) 1990 වර්ෂයේ ද. 1991 වර්ෂයේ කොස්ඉන්න ගම්මානයේ අඩි 500 ක කොන්ක්‍රීට් පඩි බැඳීමට රුපියල් දෙලක්ෂ හැත්තෑ පන්දාහක් ද (2,75,000) වැයකර ඇත.

### ස්වයං රැකියා:

සෙංකඩගල හා මහනුවර ස්වයං රැකියා ලාභීන් වෙනුවෙන් පුහුණු වැඩ සටහන් සඳහා රුපියල් දෙලක්ෂ හැත්තෑ පන්දාහක් (2,75,000) වැයකර ඇත.

### පොදු සේවා:

1989 වර්ෂයේ පොදු සේවාවන් වශයෙන් ආගමික ස්ථාන ප්‍රතිසංවර්ධනය කිරීම වැදගත් තැනක් ගනී. කඩුගන්නාව පුරාණ ධර්මසර විහාරය පිළිසකර කිරීම. සියඹලාගොඩ විහාරස්ථානයට පුස්තකාලයක් හා දේශන ශාලාවක් ඉදිකිරීම. උඩුවැල්ල ජේතේද්‍රාරාම විහාරයේ චෛත්‍ය සෑදීම. පේරාදෙණිය උඩ ඊරියගම දෙවොල්ගොනු විහාරස්ථානයේ ගොඩනැගිල්ල සෑදීම හා යටිනුවර ශාසනාරක්ෂක බලමණ්ඩලයේ දියුණුව සඳහා මුදල් වැයකිරීම වශයෙන් ආගමික සංවර්ධනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැයකර ඇත. 1990 දී දේවාල ප්‍රතිසංස්කරණය, ප්‍රජාශාලා. ජලනල යෝජනා. පුස්තකාල සංවර්ධනය. සෞඛ්‍ය පහසුකම් ඇති කිරීම වැනි මහජන සුභසිද්ධියට අවශ්‍ය කරනු ලබන මූලික පහසුකම් සැලසීමට පියවර ගෙන ඇත.

## ඒ. ආර්. එම්. ඒ. කාදර් මැතිතුමා :

### විදුලිය:

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ. ආර්. එම්. ඒ. කාදර් මහතා විදුලිය සඳහා 1989. 1990. 1991 වර්ෂවල දී පිළිවෙලින් රුපියල් නම ලක්ෂ දෙදාස් පන්සිය පණස් හතරක් (902,554) තුන් ලක්ෂ අසූදාස් නමසිය විසි නමයක් (380,929) රුපියල් හතළිස් හතර දාස් හාරසිය විසි දෙකක් (44,422) මුදලින් වැයකර ඇත.

1989 වසරේ දී ලෙව්වම් වැතිලා ජනපදයට විදුලිය සැපයීම වෙනුවෙන් පමණක් රුපියල් දෙලක්ෂ තිස්හත්දාස් පන්සියක් (237,500) මුදලක් වැයකර ඇත. 1990 වසරේ විදුලියදීම සඳහා වැඩිම මුදලක් වියදම් කර ඇත්තේ ඇත්ගාල ජනපදයටය. එනම් රුපියල් දෙලක්ෂ අසූ අටදාස් හාර සියයකි. (288,400) මූංවතුගොඩ රජයේ මුස්ලිම් විදුහලට රුපියල් විසිදාස් හයසිය පණහක (20,650) මුදලක් වැයකර විදුලිය ලබාදීමට කටයුතු කර ඇත.



ඒ.ආර්.එම්.ඒ. කාදර් මැතිතුමා

(400,000) වැයකර ඇත. රුපියල් හාර ලක්ෂ පණස් දාහක (450,000) මුදලක් 1991 වසර සඳහා වියදම් කර තිබේ.

### චන්ද්‍රාකරුණාරත්න මැතිතුමා : (1990 දෙසැම්බර් මස සිට)

**මහාමාර්ග.:**

විමධ්‍යගත අයවැයෙන් තමාට වෙන්කළ මුදල් ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය ඇතුළු පොදුසේවා රැසක් සඳහා වැයකර ඇත. මහාමාර්ග කටයුතු වෙනුවෙන් 1991 වසරේ දී සංවර්ධනය සඳහා රුපියල් හාර ලක්ෂ පණස්දහසක (450,000) මුදලක් වැයකර ඇත.

**ජල සම්පාදනය:**

මැණික්හින්න ජල යෝජනා ක්‍රමය මහරතැන්න හා උඩගම ගල්ජදණ්ඩ දක්වා සවිකිරීම සඳහා රුපියල් දෙලක්ෂ පණස් දාහක් ද, ඉත්තමල්ලියගොඩ, මහවත්ත සිට පිලවල දක්වා ජල සැපයුම සඳහා රුපියල් දෙලක්ෂ හැත්තෑ දාහක් (270,000) ද වැයකර ඇත.



චන්ද්‍රාකරුණාරත්න මැතිතුමා

**පොදු සේවා:**

දෙගල්පෝරුව ප්‍රජාශාලාව තැනීම වෙනුවෙන් රුපියල් එක් ලක්ෂ පණස් දාහක් (150,000) වියදම් කර ඇත. මෙයට අමතරව දහම් පාසල් සංවර්ධනය සඳහා ද රුපියල් පත් ලක්ෂ තිස් දාහක (530,000) මුදලක් වැයකර ඇත.

# පළාත් සංවර්ධනයට නායකත්වය පළාතෙන්ම

## මධ්‍යම පළාත් සභාවෙන් මහනුවර දිස්ත්‍රික්කයට

පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමගම ඒ ඒ පළාත් සභා බල ප්‍රදේශවල සංවර්ධනය පිළිබඳ වගකීම එම ප්‍රදේශවලම මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ටම පැවරුනි. තම ප්‍රදේශයේ සංවර්ධන අවශ්‍යතා අත්දැකීම් තුළින් හඳුනා ගැනීමත්, ඒ අනුව සංවර්ධන ප්‍රමුඛතා නිර්නය කොට මුදල් යෙදවීමත් ප්‍රදේශීය සංවර්ධනයේ ලා ප්‍රතිඵලදායී වන්නක් බව අවබෝධ කර ගනිමින් සෑම පළාත් සභා අමාත්‍යාංශයකටම වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කෙරිණි. මේ මගින් විමධ්‍යගත අයවැයෙන් හෝ වෙනයම් ආකාරයකින් පෝෂණය නොවූ අංශ වෙත සංවර්ධන ඉලක්කයන් යොමු කරවීමට ඉඩප්‍රස්ථා ලැබේ. මධ්‍යම පළාත් සභාව මගින් සංවර්ධන කටයුතු සඳහා 1989 සිට 1991 දක්වා ඒ ඒ පළාත් සභා අමාත්‍යාංශය වෙනුවෙන් වෙන්කර ඇති මුදල පහත දැක්වේ.

| පළාත් සභා අමාත්‍යාංශය | මුදල | | |
|---|---|---|---|
| 1. ඉඩම්, පේෂකර්ම, පළාත් පාලන හා සංස්කෘතික | රු. 11,06,800 | 1,49,61,147 | 5,80,777 |
| 2. කෘෂිකර්ම, වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති, ධීවර රැකිරක්ෂා හා පරිසර කටයුතු | රු. 13,38,866 | 2,47,73,674 | 7,33,483 |
| 3. සෞඛ්‍ය ආහාර සමුපකාර, වෙළඳ හා වාණිජ, ක්‍රීඩා හා සංචාරක | රු. 13,42,757 | 7,78,71,103 | 40,79,254 |
| 4. ප්‍රවාහන, මහාමාර්ග තරුණ සේවා, වනිතා කටයුතු, නිවාස ඉදිකිරීම | රු. 12,51,178 | 34,13,233 | 19,54,335 |
| 5. අධ්‍යාපන කර්මාන්ත හා සත්ව පාලන | රු. 8,53,078 | 11,34,23,835 | 36,50,322 |



මධ්‍යම පළාත් ආණ්ඩුකාර
පී.සී.ඉඹුලාන මැතිතුමා



මධ්‍යම පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය
ඩබ්.පී.බී.දිසානායක මැතිතුමා

1992 වර්ෂය සඳහා පමණක් මහනුවර දිස්ත්‍රික්කයේ කරන ලද සංවර්ධන කාර්යය වෙනුවෙන් රුපියල් කෝටි දෙකහමාරකට ආසන්න මුදලක් වෙන්කර ඇත. එම මුදලින් මෙතෙක් කරන ලද සංවර්ධන කාර්යය පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

### 1. ඉඩම්, පේෂකර්ම, පළාත් පාලන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය:

**ඉඩම්:**

සෑම පළාත් සභා බල ප්‍රදේශයකම ඉඩම්වල පස සංරක්ෂණය කිරීම සඳහා රුපියල් දොලොස් ලක්ෂ හැට හතරදාහක් (1,264,000) වෙන්කර ඇත. මින් වැඩිපුර මුදලක් වූ රුපියල් අනූ දාහක (90,000) මුදල යොදවා ඇත්තේ තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිරිමැටියගහවත්ත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ය.

### පේෂකර්ම :

රුපියල් තිස් හය ලක්ෂ දහතුන් දාස් හාරසිය විසිතුනක මුදලක් ප්‍රාදේශීය සභා දහසයක් තුළ පේෂකර්ම කටයුතු නංවාලීම සඳහා වෙන්කොට ඇත. මෙම මුදල් වැඩි වශයෙන් යොදවා ඇත්තේ පේෂකර්මාන්ත මධ්‍යස්ථාන ආරම්භ කිරීම, අමුද්‍රව්‍ය ලබාදීම හා ආධුනිකාවන් පුහුණු කිරීම යනාදිය සඳහාය. මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහ ඇස්වැද්දුම පේෂකර්ම මධ්‍යස්ථානයේ විවිධ අංශ වෙනුවෙන් රුපියල් හය ලක්ෂ හැටදාස් පන්සිය විස්සක මුදලක් වෙන්කර ඇත.

### සංස්කෘතික කටයුතු :

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පල්ලෙකැලේ ජනසවිගම විශ්ව කලා කේන්ද්‍රය සඳහා රුපියල් ලක්ෂයක් වැයකර ඇත. මෙහි අරමුණ ආගම හා සංස්කෘතිය නංවාලීමය.

## 2. කෘෂිකර්ම, වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති, ධීවර, රැකී රක්ෂා, හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය :

### කෘෂිකර්මය :

ඉහත කී අමාත්‍යාංශය මගින් මහනුවර දිස්ත්‍රික්කයේ දියුණුව සඳහා රුපියල් තිස් ලක්ෂයක මුදලක් 1992 වසර සඳහා වෙන්කර ඇත. මෙම මුදලින් කෘෂිකර්මාන්තය නංවාලීම සඳහා රුපියල් පන් ලක්ෂ තිස් දහසක මුදලක් වෙන්කර ඇත. ප්‍රාදේශීය සභා දහයක ඇතුළත බිත්තර වී නිෂ්පාදනය හෝ වැඩිදියුණු කිරීම සඳහා මුදල් වැයකර ඇත. ඒ හැරුණු විට මාළිගාතැන්න, කෝපිවත්ත යන කෘෂි ගම්මාන සංවර්ධනය සඳහා මුදල් යොදවා ඇත.



ආර්.බී.ඒකනායක මැතිතුමා

### වාරිමාර්ග දියුණුව :

ප්‍රදේශයේ කෘෂි සංවර්ධනය සඳහා වාරිමාර්ග සංවර්ධනය අවශ්‍යමය. මේ සඳහා රුපියල් දස ලක්ෂ පහළොස් දාහක මුදලක් හිඳගල ග්‍රාම සේවා වසමේ කටුගල ඇල වැඩි දියුණු කිරීමට යොදවා ඇත. වැලිවිට පිං කුඹුර ඇලේ පැති බැම්ම සකස් කිරීම සඳහා රුපියල් පනස් දහසක්ද, වැයකර ඇත. යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාරි යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් එක් ලක්ෂ පන්දාහක්ද. උඩ ප්‍රාදේශීය සභාව සඳහා රුපියල් එක් ලක්ෂ විසි දෙදාහක් ද වැයකර ඇත. බොහෝ විට පවත්නා වැව් පිළිසකර කිරීමට වැඩි වශයෙන් මුදල් යොදවා ඇත.

### පරිසර කටයුතු :

පරිසර සංරක්ෂණයත්, මාර්ග අලංකාරයත්, පැරණි ගම් කැලෑ ඇති කිරීමේත් පරමාර්ථය ඇතිව මාර්ග දෙපස රුක් රෝපණය, ප්‍රජා වන වගා, ඔසු උයන්, පැල තවාන් ඇතිකිරීම වැනි දෑ මෙම අංශයෙන් ඉටු වී ඇත. මේ සඳහා රුපියල් ලක්ෂයක පමණ මුදලක් වැයකර ඇත.

### ස්වයං රැකියා :

මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ දහසයක් ඇතුළත රුපියල් දහසය ලක්ෂයක් වැයකරමින් තරුණ තරුණියන්ගේ දක්ෂතා ඔප්නැංවීමට සහාය වී ඇත.

## 3. සෞඛ්‍ය, ආහාර හා සමුපකාර, වෙළෙඳ හා වාණිජ, ක්‍රීඩා හා සංචාරක අමාත්‍යාංශය :



එම්.එච්.ඒ.හලීම් මැතිතුමා

නිරෝගීමත් ජනතාවක් බිහිකිරීමේ අරමුණ ඇතිව රුපියල් විසිපත් ලක්ෂ තිස් දෙදාස් එකසිය තුනක විශාල මුදල් ප්‍රමාණයක් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභසිද්ධිය සඳහා වෙන්කර ඇත. මෙම මුදල් නගරයේ සෞඛ්‍ය පහසුකම් නංවාලීම මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ආරෝග්‍යශාලා වැඩිදියුණු කිරීම සඳහා වැයකර ඇත. තලාතුඔය ග්‍රාමීය රෝහල් සංවර්ධනය සඳහා රුපියල් තුන් ලක්ෂ අසූ දාහක්ද, බෝත්ගාවල ග්‍රාමීය රෝහල් ළමා වාට්ටුව තැනීම සඳහා රුපියල් හැත්තෑ පන් දහසක් ද, අළුත්ගම ග්‍රාමීය රෝහලේ වාට්ටුව ඉදිකිරීම සඳහා රුපියල් එක් ලක්ෂ හතළිස් අටදා හක් ද, අකුරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා මැණික්හින්න දිසා රෝහලේ වාට්ටු අළුත්වැඩියාව සඳහා රුපියල් දෙලක්ෂ හැත්තෑ දහසක මුදලක් ද වැයකර ඇත. මේ හැරුණුවිට වෙඩරාව, සූජරා වැනි සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා හාර ලක්ෂ පන්දාහක මුදලක් වැයකර ඇත.

## 4. ප්‍රවාහන, මහාමාර්ග, තරුණ සේවා, වනිතා කටයුතු, නිවාස ඉදිකිරීම්, සමාජ සේවා, පරිවාස හා ළමා රක්ෂණ සේවා,

## ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය :

මෙම අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික්කයේ මහා මාර්ග සංවර්ධනය උදෙසා විශාල මුදලක් වැයකර ඇත. රුපියල් විසි අට ලක්ෂ විසිදාහක මුදලක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ දහසයක මාර්ග සංවර්ධනය සඳහා යොදවා ඇත.

මින් වැඩිම මුදල වන රුපියල් හාර ලක්ෂයක් (400,000) ගඟඉහළ කෝරලය බල සහා ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය සඳහා වැයකර ඇත.



පද්මකීර්ති ප්‍රේමචන්ද්‍ර මැතිතුමා

### නිවාස :

එක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් හැරුනවිට අනෙකුත් සෑම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයකටම රුපියල් ලක්ෂය බැගින් රුපියල් දහසය ලක්ෂයක් නිවාස තැනීම හෝ අළුත්වැඩියාව සඳහා වෙන්කර ඇත. පරිවාස හා ළමාරක්ෂණ සේවා සඳහා ගඟවට කෝරලය ප්‍රාදේශීය සභාවට රුපියල් ලක්ෂයක් වෙන්කර ඇත.

## 5. අධ්‍යාපන, කර්මාන්ත හා සත්ව පාලන අමාත්‍යාංශය :

1992 වර්ෂයේ පළාත් සභා අරමුදල් වලින් වැඩිම මුදලක් වැයකර ඇත්තේ මෙම අමාත්‍යාංශය යටතේය අධ්‍යාපනය සඳහා පමණක් රුපියල් පනස් නව ලක්ෂයක්ද, කුඩා කර්මාන්ත සඳහා රුපියල් දශ ලක්ෂයක්ද ස්වයං රැකියා සඳහා රුපියල් දහසය ලක්ෂයක්ද වෙන්කර ඇත.



එස්.එම්.කේ. රාමනාදන් මැතිතුමා

### අධ්‍යාපන :

විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහී යන්නන්ට වෘත්තීය දක්ෂතා ලබාදීමේ අරමුණින් අධ්‍යාපන, පර්යේෂණ, පුහුණු හා නොවිධිමත් අධ්‍යාපන වැඩ සටහන් ගඟවටකෝරළේ, පාතහේවා හැට, හාරිස්පත්තුව, කණ්ඩසාලේ සහ උඩපලාත යන ප්‍රාදේශීය සභාවල ක්‍රියාත්මක කිරීමට රුපියල් පණස් නම දහක් (59,000) වැයකර ඇත. එයිනුත් රුපියල් විසි ලක්ෂයක් වන වැඩි මුදල වැයකර ඇත්තේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ භෞතික අවශ්‍යතා හා මූලික ක්‍රීඩා පහසුකම් සැළසීම සඳහාය.

### කර්මාන්ත :

මධ්‍යම පළාත තුළ කලාත්මක රෙදි නිෂ්පාදනය හා රැකී රක්ෂා ඉඩ ප්‍රස්ථා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මැදවෙල තුල් සායම් කිරීමේ ආයතනය වැඩි දියුණු කිරීම සඳහා රුපියල් හාර ලක්ෂයක මුදලක් වැයකර ඇත. ගඟවට කෝරලයේ කර්මාන්ත ප්‍රදර්ශනයක් හා අලෙවි සල්පිලක් පැවැත්වීම සඳහා රුපියල් එක් ලක්ෂ පනස් දහසක්ද, සේවා නියුක්තිකයන් දැනුවත් කිරීම සඳහා කුඩා කර්මාන්ත පුහුණු සේවා නිෂ්පාදන ආයතනවල වැඩ මුළු පැවැත්වීම සඳහා රුපියල් එක් ලක්ෂ පනස් දාහක්ද, මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජංගම ජුකී පුහුණු ඒකකයක් ආරම්භ කිරීමට රුපියල් තුන් ලක්ෂයක්ද වැයකර ඇත.

### ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් :

මහනුවර දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ පහ බැගින් වෙන්කර ඇත. එම මුදල තමන්ට කැමති ප්‍රදේශයක සංවර්ධන කටයුතු නංවාලීම සඳහා යෙදවීමට ඔවුන්ට අවසර ඇත. තම ප්‍රදේශය තුළ ආර්ථික සංවර්ධනය උදෙසා කැපවීමකින් යුතුව මෙම මුදල් යෙදවීමට ඔවුනට ඉඩකඩ සැළසේ.

මේ අනුව ප්‍රාදේශීය වශයෙන් සංවර්ධන ප්‍රමුඛතාවයන් හඳුනා ගත හැකි නිසා මෙම වැඩ පිළිවෙල තුළින් විමධ්‍යගතකරණය ගම මට්ටම දක්වාම ළඟා වනු ඇත.

## ගැමි ජන සුබසෙතට ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

මහනුවර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය උප දිසාපති කොට්ඨාශ පහක ජර්මන් ආධාර යටතේ 1989 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

1989 වර්ෂයේ මහනුවර දිස්ත්‍රික්කයේ රජයේ නිලධාරීන් සහභාගී වූ සැලසුම් වැඩමුළුවේ නිර්දේශ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම් සඳහා පහත නම් සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහ තෝරාගෙන ඇත.

(1) පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
(2) ගඟ ඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
(3) උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
(4) මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
(5) මැද දුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මෙයින් 1989 සිට පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දිළිඳු ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමේ අරමුණ ඇතිව සකස් කරන ලද්දක් බව ව්‍යාපෘතියේ අඩංගු මූලධර්ම වලින් පැහැදිලි වේ. ඒවා නම්.

(1) දිළිඳු බව පදනම් වීම.
(2) නිෂ්පාදිතය හා ආදායම් ඉපයීම.
(3) රැකියා අවස්ථා ඇති කිරීම.
(4) මහජන සහභාගීත්වය.
(5) සමාජ, සංස්කෘතික හා මානව සංවර්ධනය.
(6) දිගුකල් පැවැත්ම.



පාත හේවාහැට ඇතුල්ගම කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියක්

ඉහත සඳහන් මූලධර්ම අනුව සලකා බලනවිට මෙම ව්‍යාපෘති ආධාරවල ඉලක්ක කණ්ඩායම දිළිඳු ජනතාව බව පැහැදිලිය. එම ජනතාවගේ සමාජ සංස්කෘතික හා මානව සංවර්ධනයත්, එය සලසා ගැනීමේදී පරිසර සංරක්ෂණයත් සලසා ගනිමින් නිෂ්පාදිතය ඉහල නැංවීමට බලාපොරොත්තු වේ. විශේෂයෙන්ම එහි වැදගත්කම රදා පවතින්නේ ඒ සඳහා මහජන දායකත්වය ලබාගැනීම තුළින්ය. මහජනයාගේ කැමැත්ත අනුව එහි දිගුකාලීන බව රදා පවතී. මෙම මූලධර්ම අනුව ඉහත සඳහන් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශවල මූලිකත්වය ලැබිය යුතු අංශ කෙරේ ප්‍රතිපාදන යොදවා ඇත.

මූලික වශයෙන් වැඩි ජනතාව කෘෂිකර්මාන්තය මුල්කර ගත් ජීවනෝපායකට යොමුව ඇති බැවින් ප්‍රතිපාදන වෙන්කිරීමේ දී ප්‍රමුඛතාවය කෘෂිකර්මයට දී ඇත.

1988/91 වර්ෂය ඇතුලත පාතහේවාහැට ප්‍රාදේශීය යතාව තුල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිලාභී පිරිසගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ඒ ඒ අංශවලට වැයකර ඇති මුදල කෝටි හතරකට වඩා වැඩිය. කිතුල්ගල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 31 ක් සඳහා රු.307,999/-ක්ද, කෝන්ගහපිටිය, වෙලේගම්මැද්ද, රතමඩි යන ගම්වල කිරිගවයන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.268,507/-ක්ද වැයකර ඇත. කිතුල්ගල ප්‍රදේශයේ කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන් 31ක් සඳහා රු.307,999/-ක්ද, කෝන්ගහපිටිය, වෙලේගම්මැද්ද, රතමඩි යන ගම්වල කිරිගවයන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.268,507/-ක්ද වැයකර ඇත.


ඒ හැරුනවිට පොදු ජන සුභසිද්ධියට හේතුවන ප්‍රජාශාලා, පුස්තකාල, පෙර පාසැල්, විද්‍යාගාර ඉදිකිරීමත්, පෝෂණ ගම්මාන ඉදිකිරීම හා වැසිකිළි ඉදිකිරීමේ ව්‍යාපාර මගින් සෞඛ්‍ය තත්ත්වය නගාලීමත්, කුකුල් පාලන ව්‍යාපෘති මගින් ස්වයං රැකියා ඉඩප්‍රස්ථා ජනිත කිරීම සඳහාත් මෙම ප්‍රතිපාදන යොදවාතිබේ.ජල ප්‍රශ්ණය උග්‍රව පවතින මෙම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල ජනතාවට පානීය ජලය ලබාගැනීමට පහසුකම් වැඩිදියුණු කිරීම අනුව වෙලේගම්මැද්ද නගරයේ නල ළිං 04ක් ඉදිකිරීම සඳහා රු.268,507/-ක් වැයකර ඇත.

උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 1992 වර්ෂය සඳහා රු.2,366,000/-ක මුදලක් අක්කර 100ක නැවත වගාව, අපනයන කෘෂි බෝග වගා, මීමැසි, හා එළු පාලන ව්‍යාපෘති සඳහා වැයකර ඇත. වාරිමාර්ග හා මහාමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රු.4,88,000/-ක්ද, සමාජ පොදු කාර්ය සඳහා රු.7,17,000/-ක මුදලක්ය වැයකර ඇත.

ගඟඉහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්වයං රැකියා ව්‍යාපෘති 04ක් සඳහා මුදල් වැයකර ඇත. මේ අතර මියනගොල්ල, රාක්ෂාව, හැරපොල හා උලපනේ ප්‍රදේශවල ඇත්තුරියම් වගාව, මීමැසි පාලනය, ගව පාලනය, තනු වගා ව්‍යාපෘති ඇත. මේ හැරුනු විට වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, විද්‍යාගාර පහසුකම් ලබාදීම වැනි දෑ ඉටුකර ඇත.

මහනුවර නගරයේ ඇත ප්‍රදේශයක් වන මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේද, මීමැසි පාලනය, එළුපාලන ව්‍යාපෘති සහ වාරි යෝජනා ක්‍රම, පාසැල් සංවර්ධනය වැනි දෑ සිදුකර ඇත.

මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෘෂි අංශය නගාලීම සඳහා සමෝදාන ගොවිපොල ආරම්භ කිරීම, එළු පාලන ව්‍යාපෘති වැනි දෑ ආරම්භ කර ඇත. එමෙන්ම කටකිතුල – රම්මුල්ල හේකන්ද හරහා වැගල මාර්ගය ප්‍රතිසංස්කරණය කර ඇත.



පාත හේවාහැට පැහිගල්දෙණිය ප්‍රජාශාලාව



පාත හේවාහැට ප්‍රදේශයට ඉදිකර දී ඇති නළ ළිං

## උඩරට ගැමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය.

උඩරට ගැමි පුනරුත්ථාපන අමාත්‍යාංශය මගින් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලබන දිස්ත්‍රික්ක 04කි. ඒ අතුරින් දෙපාර්තමේන්තුව ස්ථාන ගතකර ඇති මහනුවර දිස්ත්‍රික්කය ප්‍රධාන වේ. උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඇත්තේ ද ඉහත කී දිස්ත්‍රික්කවල ගැමියන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික ජීවන තත්ත්වයන් ඔප්නැංවීමටය. දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්කවලට වඩා මහනුවර දිස්ත්‍රික්කයට වසරක් පාසා මෙම විශේෂ ප්‍රතිපාදන මූල්‍ය මගින් මුදල් විශාල ප්‍රමාණයක් වෙන්කර ඇත. 1989-91 වර්ෂය වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13ක් සඳහා රු.14,568,534/-ක් වියදම් කර ඇත. මේ මගින් ජනතාවගේ කෘෂිකාර්මික, වාරිමාර්ග, මහාමාර්ග, අධ්‍යාපන, සෞඛ්‍ය, කර්මාන්ත, ස්වයං රැකියා සහ පොදු පහසුකම් නංවාලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.




උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

REFERENCE

ප්‍රකාශනය : රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව